

# සිංහල හින්දු අළුත් අවුරුද්ද

සූර්යා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමනය වන මහා සූර්ය මංගල්‍ය ලෙස හඳුන්වනු ලබන සිංහල හින්දු අළුත් අවුරුද්ද උදාවීමට ඇත්තේ තව නොබෝ දිනකි.

වසරින් වසර ගෙවී උදාවෙන මෙම වසරේදී ඔබ කළ යුත්තේ කුමක්ද යන්න දැනටමත් ඔබ සැලසුම් කර ඇතුවාට සැක නැත. සුභ නැකතින් උදාවන නව වසරට සුදානම් වන ඔබ සියළුම දුක් දොම්නස් තුනී වී දුක් දොම්නස් වලට මුහුණ දෙන ආත්ම ශක්තිය යුතුව වාසනාවන්ත හෙට දිනක් සෙනෙහසින් ප්‍රාර්ථනා කරන ගමන්ම සිරිත් විරිත් පිළිබඳවද සිතන්න.කුඩා දරුවන්, වැඩිහිටියන්, ඥාති හිතවතුන් එකට එකතු වී සතුට බෙදා ගන්නා, අතීතයේ සිට පැවත එන උත්සවයකි සිංහල අලුත් අවුරුද්ද.

**වැඩ ඇල්ලීමේදී ද ඔබ ගිය වසරට වඩා සැලකිලිමත් වන්න. නැකැත් වේලාවට තමාට ආදරය කරන, විශ්වාසවන්ත, සෞභාග්‍යමත් අයෙකු සමඟ ගනුදෙනු කිරීමට වගබලා ගන්න. දෙමාපියන්, දූ දරුවන්, ඔබේ බිරිඳ, සැමියා සමඟ මේ චාරිත්‍රය ඉටු කිරීමත් කරන්න.**

අපේකම, සංස්කෘතිය, සදාචාරය, ආගම, පාරම්පරික ගති සිරිත් ආදිය සංකේතවක් කොට චාරිත්‍ර වාරිත්‍රවල සිංහල අලුත් අවුරුද්ද තුළින් අප ජීවිතයට බොහෝ දේ ලබාගත හැකි බව සිතට ගන්න. පැරණි සිරිත් විරිත්, ආගමික චාරිත්‍ර, වත්පිළිවෙත්, කුඩා දරුවන්ට ඉගැන්වීමට සේම, කාල කළමනාකරණය කිරීමේ වැදගත්කම දරුවන්ට උගන්වන හොඳම උත්සවය සිංහල අලුත් අවුරුදු උත්සවය වන හෙයින් රතිඤ්ඤා පිපිරවීමෙන් හෝ බටහිරෙන් ආවේනික සිරිත් විරිත් රැකීමෙන් එය සැමරීම නොකරන්න.

පාසල් නිවාඩුවත්, කාර්යාල නිවාඩුවත් හෙයින් අවුරුදු උත්සව සමයේදී සෑමදෙනාම සිටින්නේ විවේකයෙන් හා සතුටිනි. අතිරේක කැවිලි පෙවිලි සකස් කිරීමට, ගේ දොර පිරිසිදු කිරීම, ඇඳුම් පැළඳුම් සකස් කිරීම, ආගන්තුක සංග්‍රහ ආදිය කිරීමේදී පවුලේ සෑමගේ සහයෝගය මේ සඳහා දායක කර ගන්න.
විශේෂයෙන්ම පරණ තරහ මරහා, හිත් නොහඳකම් තිබුණ ඥාතීන් හිතවතුන්ටද අවුරුදු සැමරීමේදී දායක කර ගන්න. එය ඔබලාට අලුත් අත්දැකීමක් වේවි.

අවුරුදු උදාවට පෙර පරණ අවුරුද්දේ වැඩ අත් හැරීමේ චාරිත්‍රයටද ඔබ මුල් තැනැක් දිය යුතුය. අතීතයේ අපේ ගැමි නිවෙස්වල සතුට සෞභාග්‍ය රැන්දු ඒ චාරිත්‍ර. චාරිත්‍ර ඉදිරියට ගෙන යෑමට ඔබ සිතට ගන්න. අවුරුදු උදාවට පෙර ලිපේ අලු සියල්ල ඉවත් කර, නැවත ලිප ගිනි මෙළවීම නැකතකට අනුව සිදුකරන දැල්වෙන ගින්නේ ආලෝකය සේ අපගේ ජීවිත ආලෝකමක් වේවා ෟ කරදර, කම්කටළු සියල්ලක්ම ගින්නේ දැවී ගොස්, සතුට දියුණුව අපට ලඟාවේවා යැයි ඔබ නිරතුරුවම සිතන්න. ලිප ගිනි මෙලවීම අධ්‍යාත්මික සංකේතයක් වන හෙයින් එම චාරිත්‍ර ඉටු කිරීමෙන් ඔබේ ජීවිතයට නැවුම් බවක්ද ඇති වන්නේය.

අලුත් අවුරුදු උදාවට පෙර සමරනු ලබන නොනගත කාලය ද සුවිශේෂි චාරිත්‍රයක් වේ. නොනගත කාලය යනු වසරක අවිවේකි ජීවිතයෙන් මඳක් මිදි සැනසීමෙන් සිටින කාලයයි. දරුවන්, ඥාතීන් සමඟ එකට එකතු වී ආගමික වතාවත් වල යෙදී, උදාවන අවුරුද්දට සුදානම් වීමට ඔබ මෙහිදී වගබලා ගත යුතුය.
අවුරුදු උදාවත් සමඟ කිරි ඉතිරවීමද, පවුලේ සතුට, විනෝදය, සංස්කෘතිය රන්දන එකක් වේ. කිරි ඉතිරවීමේදී බොහෝ අය පොල් කිරි භාවිතා කළ ද, විද්වත් මතය අනුව වඩාත් උචිත වන්නේ එළකිරි ය. ඇතමුන් එළකිරි ඉතිරවීම පව්කාර වැඩක් යැයි මතයක් නැගුවද, වඩාත්ම යෝග්‍ය වන්නේ, නිවසක් තුළ එළකිරි ඉතිර වීමය.

පවුලේ සෑමදෙනාම වට වී උතුරනු ලබන ඉතිරි යන කිරි දෙස බලාගෙන අපේ ජීවිතයද මේ අයුරින් සෞභාග්‍යයෙන්, සතුටින්, ඉතිරි යන්න යැයි ප්‍රාර්ථනා කරන්න. කිරි ඉතුරු පසු එම කිරි මුළු නිවසටත්, ගේ මිදුලටත් ඉසින්න.

නිවසේ ගෘහමූලිකයා අතින් විවෘත වන කෑම මේසයද අවුරුදු දා ඉටු කෙරෙන හොඳම චාරිත්‍රයක් වේ. නැකතට ඉදුණු කිරිබත්, සතුටින් විනෝදයෙන් බැදපු කැවුම් කොකිස්, සියල්ලන් සමගින් සතුටින් භුක්ති විඳින අවස්ථාවද ඔබ අනිවාර්‍යයෙන්ම සමරන්න. කෑම මේසය මත පහනක් තබා, එය සියලුදෙනා විසින්ම දල්වා, එම වැඩකටයුතු ආරම්භ කරන්න. පුංචි කිරිබත් පිඩක් සෑමදෙනාටම කවා, ආදරය, සෙනෙහස ගිය වසරේ වගේම ලැබූ වසරේදීත්, ඉදිරියටත් රැක ගන්නා බව එයින් සංකේතවත් කරන්න.

වැඩ ඇල්ලීමේදී ද ඔබ ගිය වසරට වඩා සැලකිලිමත් වන්න. නැකැත් වේලාවට තමාට ආදරය කරන, විශ්වාසවන්ත, සෞභාග්‍යමත් අයෙකු සමඟ ගනුදෙනු කිරීමට වගබලා ගන්න. දෙමාපියන්, දූ දරුවන්, ඔබේ බිරිඳ, සැමියා සමඟ මේ චාරිත්‍රය ඉටු කිරීමත් කරන්න.

හමුවෙන සෑම අයෙකුටම රැකියාවේ මෙන්ම ඔබට හිතවත් සෑමදෙනාටම සුභ පතන්න. ඔවුන් බැලීමට යන්නේ නම්, කේක්, වර්ග, බිස්කට්, කැවිලි වර්ග ගෙනි යනවා වෙනුවට ඔවුන්ට ප්‍රයෝජනවත් යමක් ගෙනි යන්න. එය ඔවුන්ට ඔබව අවුරුද්ද පුරාම මතක් වන්න සිහිවටනයක් වේවි.

ඇඳුම් පැළඳුම් ගැනීමේදීත් සැලකිලිමත් වන්න. විශාල මුදල් වියදම් කර පවුලේ සාමාජිකයන්ට පමණක් ඇඳුම් පැළඳුම් නොගෙන, ඔබට හිතවත් ආර්ථික අපහසුතා මධ්‍යයේ සිටිනා අයෙකුට, ඔබේ ඥාති සහෝදරයන්ට, එවැනි යුතුකම් ඔබට හැකි අයුරින් ඉටු කරන්න. එය ඔබට වගේම, ඒ අයටද සුවිශේෂි දෙයක් වනවාට සැක නැහැ.

සිංහල අලුත් අවුරුද්දේ ජාති, ආගම් බේද නොතකා එකට එකමුතු වන තවත් අංගයක් අවුරුදු උත්සවය. ඔබගේ වටපිටාවේ සිටින අය, හිතවතුන්, ඥාතීන්, දූ දරුවන් එක්ව ඔබත් මෙවැනි දේ කරන්න. එකමුතුකම, විනෝදය පමණක් නොව මේ තුළින් අපේකම කියාපාන සංස්කෘතික අංගයන්ද ඔබට ඉදිරියට ගෙන යා හැකි වේවි.

උත්සවය සැමරීමට විශේෂයෙන්ම ඔබ වැඩිහිටියෙකු වශයෙන් බොහෝදුරට අන් අයට ආදර්ශමත් වන්නට උත්සාහ කරන්න. මත්පැන්, මූලික කොටගත් අවුරුදු උත්සවයකට ඔබ දායක නොවන්න. නැකතකින්, සුභ මොහොතකින් උදාවන නව අවුරුදු උදාව, කාලකණ්ණි, මූසල එකක් කරවන මත්පැන්, මත්ද්‍රව්‍ය මේ වසරේ සිට නිවසට නොගෙනෙන බවට ඔබ අධිෂ්ඨාන කර ගන්න.

වසරක් ගෙවී වසරක් උදාවත්ම චාරිත්‍ර වාරිත්‍ර, නැකත්, සිරිත් වලට මෙන්ම, පසුගිය වසරේ සිදුවූ අඩුපාඩු ලබන වසරේදීත් ඉටු නොකිරීමට වග බලා ගන්න.

නව වසරේදී ඔබත්, ඔබේ දරුවනුත් යම් ඉලක්කයකට අනුව වැඩ කරන්න. යම් යම් ඉටුවිය යුතු අවශ්‍යතා ලැයිස්තු කර එම අවශ්‍යතා වලට අනුව ඔබ ජීවිතය හැඩ ගස්වා ගන්න. ඔබට නව වසර නැවුම් අත්දැකීමක් වේවි.

ඔබ සැමට සාමය සතුට පිරි සුභ නව වසරක් වේවා ෟ

සටහන :- **දිනුවන්දි පීරිස්**

# අර්ථවත් යමක් කිරීමට අර්ථපතියන්ගේ හිඟයක්

රොෂාන් කුරුප්පු

ඔහු උපතින්ම උරුමකම් කීවේ ඇඳීමටය. ඒ අනුව ඔහු ශිෂ්‍ය අවධියේ සිටම ඇඳියි. උසස් පෙළින් පසුව ඔහු එම ඇඳීම ව්‍යාපාරයක් සමඟ සම්බන්ධ කරයි. එනම් සාමාන්‍ය ප්‍රමාණයේ ප්‍රචාරක ආයතනයක් පටන් ගෙන පවත්වාගෙන යයි. ඇඳීමට අමතරව ඔහු සංගීතයටද මහත් සේ ඇලුම් කළේය. ඒ සම්බන්ධයෙන් ඩ්‍රම්ස් වාදකයෙකු ලෙස පුහුණුව ලබා සිටි ඔහු තමන් උපන් ප්‍රදේශය වන මීරිගම ප්‍රදේශයේම හිතමිතුරු සංගීත කණ්ඩායමක ඩ්‍රම්ස් වාදකයා ලෙසද මෙම කාලයේම කටයුතු කළේය.
මෙසේ සිටින අතරතුර ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වාගෙන යන වීඩියෝ වැඩසටහන් නිෂ්පාදන පාඨමාලාව පිළිබඳව ඔහුට අසන්නට ලැබෙයි. එය ඔහුගේ ජීවිතයේ තීරණාත්මක හැරවුම් ලක්ෂහය බවට පත්වෙයි. ඒ සඳහා අයදුම් කරන ලදුව ඔහුව ඒ සඳහා තෝරා ගනු ලැබෙයි. ඔහු ගමේ වූ සියල්ල අතහැර කොළඹ පැමිණෙයි. මාස නවයක් පුරා පැවැත්වෙන පාඨමාලාව සාර්ථකව නිම කරයි. එනමුත් ඉන්පසුද ඔහු නැවත ගමට යාමට නොසිතයි. කොළඹම නැවතී රූපවාහිනී වැඩසටහන් අධ්‍යක්ෂවරුන්, නිෂ්පාදකවරුන් හඳුනා ගනිමින් ඔවුන්ගේ වැඩ කටයුතුවලට හවුල් වෙයි.
එහි ප්‍රතිඵලය වන්නේ නොබෝ දිනකින්ම ඔහු ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාශීලි සහය අධ්‍යක්ෂකවරයෙකු බවට පත්වීමයි.
ඉන්පසුව ඔහු මහාචාර්ය සුනිල් ආරියරත්නගේ -සුදු සෙවණැලි” ඔස්සේ චිත්‍රපට සහය අධ්‍යක්ෂණයටද පිවිසෙයි.
මෙම කාලයේදී ඔහු -සුභ රාත්‍රියක්” නම් වූ නත්තල් ඒකාංගික ටෙලි නාට්‍යය අධ්‍යක්ෂණය කරමින් රූපවාහිනි අධ්‍යක්ෂණ ක්ෂේත්‍රයටද පියවරක් තැබූ අතර එම නාට්‍යය ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය විය.

මෙසේ කාලය ගෙවී යමින් තිබියදී දිනක ටෙලිනාට්‍ය නිෂ්පාදකවරයෙකු වන තුෂාර පීරිස් ඔහු සොයා පැමිණෙයි. එසේ පැමිණ -ආදරණීය අම්මා” නම් වූ ටෙලිනාට්‍ය පිටපතක් ඔහු අත තබමින් එය අධ්‍යක්ෂණය කරන මෙන් ඉල්ලා සිටියි. වෘතාන්ත ටෙලිනාට්‍ය අධ්‍යක්ෂණයට පිවිසීමට කල්යල් බලමින් සිටි ඔහුට මෙය මහඟු අවස්ථාවක් විය. ඔහු අභියෝගය භාරගෙන එය අධ්‍යක්ෂණය කළේය. පාලිත සිල්වා, චාන්දනී සෙනෙවිරත්න, නිල්මිණී තෙන්නකෝන්, වසන්ත මොරගොඩ ආදී ජනප්‍රිය නළු නිළියන් රඟ පෑ එම ටෙලිනාට්‍යය ස්වාධීන රූපවාහිනිය ඔස්සේ විකාශනය විය.

ඔහුගේ ඊළඟ ටෙලි නිර්මාණය වන්නේ -මිහිදුම් සෙවනැලිය” ජීවන් කුමාරතුංග, බිමල් ජයකොඩි, ගයනී ගිසන්තිකා, ආදී ජනප්‍රිය නළු නිළියන් රඟපෑ එය ස්වාධීන රූපවාහිනිය ඔස්සේ මෑතක් වනතුරුම විකාශනය විය. එම ටෙලිනාට්‍යයෙන් පසුව ඔහුගේ උත්සාහය වන්නේ ඉන් එහාට යමින් ප්‍රේක්ෂකයින් වෙත තවදුරටත් දැනෙන යමක් කිරීමටය. එනමුත් එබඳු අර්ථවත් දේ සඳහා අර්ථපතියන්ගේ හිඟයක් ඇති බව ඔහු පවසයි. ඒ තුළ ඔහු දකින්නේ වර්තමාන ටෙලි නාට්‍ය කලාව තුළ උද්ගත වී ඇති අර්බුදයයි. මේ සඳහා නිෂ්පාදකවරු සහ රූපවාහිනී නාලිකා සෘජුවම වගකිව යුතු බව ඔහු පවසයි. මන්ද නිෂ්පාදකවරු අඩු ආයෝජනයකින් ඉතාම බාල වර්ගයේ ටෙලිනාට්‍ය නිෂ්පාදනය කරති. අනෙක් පැත්තෙන් ඇතැම් රූපවාහිනී නාලිකා ඕනෑම බාල වර්ගයේ ටෙලිනාට්‍යයක් විකාශය කිරීමට සැදී පැහැදී සිටියි.

අතීතයේ හොඳ ටෙලිනාට්‍ය කලාවක් බිහිවූ බව ඔහු පවසයි. ධර්මසේන පතිරාජ, ධම්ම ජාගොඩ මෙන්ම ජයන්ත චන්ද්‍රසිරි, පරාක්‍රම කිරිඇල්ල ආදීන් පිළිබඳවද ඔහු මෙහිදී මතක් කොට සිටියේය. එමනිසා මේ දිනවල ඔහු ටෙලිනාට්‍ය අධ්‍යක්ෂණයෙන් මදක් බැහැරව සිටියි. ඒ වෙනුවට රූපවාහිනී වෙළෙඳ දැන්වීම්, වාර්තා වැඩසටහන් හා පෝය ටෙලිනාට්‍ය අධ්‍යක්ෂණය වෙත ඔහු යොමුවී ඇත. යම් දිනක හොඳ අර්ථපතියෙකු මුණ ගැසුණහොත් තමන් අතින් හොඳ ටෙලිනාට්‍යයක් බිහිවිය හැකි බවද ඔහු අවසාන වශයෙන් පැවසීය.

**සමන් රංචාගොඩ**